# 13 ආචාර්ය ටී. බී. ජායා

**ආචාර්ය ටී. බී. ජායා මහතා ශ්‍රී ලාංකික මුස්ලිම් ජනතාව වෙනුවෙන් පෙනී සිටි බුද්ධිමත් නායකයෙකි. ඔහු මුස්ලිම් ජනතාවගේ අධ්‍යාපන අයිතීන් වෙනුවෙන් පෙනී සිටි අතර, ඉස්ලාම් ආගමිකයන්ගේ අවශ්‍යතා වෙනුවෙන් ද ස්වකීය ජීවිතය කැප කළ ශ්‍රේෂ්ඨ නායකයකු වශයෙන් ඉතිහාසගත වී ඇත. එතුමාගේ ජීවන චරිතය අළලා 'පූජිත ජීවිත' නම් කෘතියට සිරිනිමල් ලක්දුසිංහ මහතා විසින් සම්පාදිත ලිපිය ආශ්‍රයෙන් මේ පාඩම සැකසිණි.**



තුවාන් බුහාර්නුද්දීන් ජායා, 1890 ජනවාරි මස පළමු වන දින මහනුවර දිස්ත්‍රික්කයේ ගලගෙදර නම් ගමෙහි පදිංචි ව සිටි මුස්ලිම් ජාතික පවුලක උපත ලැබුවේ ය. ඔහුගේ පියා කාසිම් ජායා නම් වූ අතර, මව නෝනා ජායා සෞජා නම් වූවා ය. දරුවන් හතර දෙනකුගෙන් යුත් පවුලක දෙවැනි දරුවා වූ ඔහුගේ ළමා විය ගෙවී ගියේ උඩරට ගැමි සුන්දරත්වයෙන් අනූන ගලගෙදර ගම් පියසෙහි හා කුරුණෑගල ප්‍රදේශයේ ය. ළමා වියේ දී ඔහුට ආලිම්වරයෙකු වෙතින් නිවසේ දී ම ආගමික අධ්‍යාපනයක් ලබා දීමට ඔහුගේ දෙමාපියෝ කටයුතු කළහ. කාසිම් ජායා සිය දරු පවුල ද රැගෙන අගනුවරට පැමිණෙන විට කුඩා තුවාන් ජායාගේ වයස අවුරුදු එකොළහකි. අගනුවරට පැමිණීමෙන් පසු ඔහුගේ ප්‍රාථමික අධ්‍යාපනය ඇරඹුණු අතර ද්විත්ව සහ ත්‍රිත්ව සාමර්ථ්‍යයන් ලබමින් දක්ෂතා පෙන්වූ ඔහු දහතුන් වන වියේ දී ගල්කිස්ස ශාන්ත තෝමස් විද්‍යාලයට ඇතුළු වූයේ ශිෂ්‍යත්වයක් ද දිනා ගනිමිනි. එහි දී ඔහු කේම්බ්‍රිජ් කනිෂ්ඨ විභාගය සමත් වූයේ කනිෂ්ඨ පන්තිවල ගණිතය සඳහා වූ ජේ. ඒ. ඩී. මැන්ඩිස් ත්‍යාගය ද දිනා ගනිමිනි. ඊට වසරකට පසු කේම්බ්‍රිජ් ජ්‍යෙෂ්ඨ විභාගය සමත් වූයේ ලතින් භාෂාව සඳහා වූ ආචාර්ය එමිල්ස් ත්‍යාගය ද හිමි කර ගනිමිනි. ඔහු 1908 දී ලන්ඩන් මැට්‍රිකියුලේෂන් විභාගයෙන් සමත් වීමට තරම් විශිෂ්ටයෙක් වූයේ ය.

පාසලෙන් අස් වූ පසු ජායා මහතා මහනුවර ධර්මරාජ විද්‍යාලයේ ගුරුවරයකු ලෙස පත් ව මාස හතක් පමණ එහි සේවය කිරීමෙන් අනතුරු ව මොරටුවේ වේල්ස් කුමර විද්‍යාලයේ ගුරු මණ්ඩලයට ඇතුළත් වූයේ ය. මෙහි දී ඔහුගෙන් අධ්‍යාපනය ලත් අය අතර පසු කලෙක ශ්‍රී ලංකාවේ දේශපාලන භූමියෙහි වැදගත් තැනක් ගත් නායකයකු වූ පිලිප් ගුණවර්ධන හා රොබට් ගුණවර්ධන සොහොයුරෝ ද වූහ. ගුරුවරයකු වශයෙන් සේවය

කරන අතර තමාගේ අධ්‍යාපන කටයුතු ද නොනවත්වා ම කරගෙන ගිය ඔහු 1911 දී බාහිර අපේක්ෂකයකු ලෙස විභාගයට පෙනී සිටිමින් ලන්ඩන් විශ්වවිද්‍යාලයෙන් බී.ඒ. උපාධිය ලබා ගැනීමට තරම් උත්සාහවන්ත වූයේ ය. මෙම උපාධි පරීක්ෂණය සඳහා ඔහු පෙනී සිටි විෂයයන් වූයේ ග්‍රීක භාෂාව, ලතින් භාෂාව, ඉතිහාසය හා ආර්ථික විද්‍යාව යි. වේල්ස් කුමර විද්‍යාලයේ සේවයෙන් පසු ඔහු කොළඹ ආනන්ද විද්‍යාලයේ ආචාර්ය මණ්ඩලයට එක් විය. වේල්ස් කුමර විද්‍යාලයේ දී ඔහුගේ ශිෂ්‍යයන් වූ පිලිප් ගුණවර්ධන හා රොබට් ගුණවර්ධන මෙහි දී ද ඔහුගේ ශිෂ්‍යයන් අතර වූහ. ඒ හැරුණු කොට ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා ද මේ වකවානුවේ ආනන්ද විද්‍යාලයේ ශිෂ්‍යයෙකු ව සිටියේ ය.

ගුරු වෘත්තිය වෙනුවෙන් ජායා මහතාගෙන් වූ සේවය ද ඉමහත් පැසසුමට ලක් වූවකි. ව්‍යවස්ථාදායක සභාව, රාජ්‍ය මන්ත්‍රණ සභාව හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය වැනි ආයතනයන්හි දී ද ඒවායින් පිටත දී ද එතුමා ගුරුවරුන්ගේ අයිතීන් වෙනුවෙන් සටන් කෙළේ ය. සමස්ත ලංකා ගුරු සංගමයේ සභාපති වශයෙන් ඒක ඡන්දයෙන් පත් වූ එතුමා ශ්‍රී ලංකාවේ ප්‍රථම ගුරු සමුළුවේ දී එහි සභාපතිවරයා වශයෙන් ද තේරී පත් විය. ගුරු වෘත්තිය පිළිබඳ ඉතා සුළු දෙය ද ඔහුගේ සැලකිල්ලට යොමු විය.

මෙරට මුස්ලිම් ජනතාවගේ අධ්‍යාපන තත්ත්වය නංවා ලීමට ඔහු විසින් ඉටු කරන ලද සේවය මුස්ලිම් ජනතාවගේ ඉමහත් ගෞරවයට පාත්‍ර ව පවතී. ගුරු වෘත්තියට ඇතුළත් වූ අවධියේ සිට ම ඔහු මුස්ලිම් ජනයාගේ අධ්‍යාපන තත්ත්වය නංවාලීමේ අවශ්‍යතාව අවබෝධ කර ගත්තේ ය. ඒ අදහස් හුදෙක් තම සිත්හි තබා ගෙන සිටිනු වෙනුවට දේශන හා ලිපි ලේඛන මඟින් සෙසු මුස්ලිම් ජනතාව අතරට එම අදහස් ව්‍යාප්ත කිරීමට ඔහු කටයුතු කෙළේ ය. තමාගේ හා කාසිම් ඉස්මායිල් මහතාගේ සම සංස්කාරකත්වයෙන් පළ කරන ලද 'සිලෝන් මුස්ලිම් රිවීව්' නම් සඟරාව මේ සඳහා අවියක් කර ගැනීමට ජායා මහතා සමත් විය. 1914 දී එම සඟරාවට ඔහු ලියූ ලිපියක ද මෙම අදහස් පැහැදිලි ව දක්වා තිබිණි. 'අධ්‍යාපනය හා ජාතික දියුණුව' මැයෙන් ලංකා මුස්ලිම් සංගමය ඉදිරියේ පැවැත්වූ දේශනයක ද මේ සම්බන්ධයෙන් විශේෂයෙන් සඳහන් වී ඇත. ඔහු එහි මෙසේ සඳහන් කළේ යː

> "අපි (මුස්ලිම් ජාතිකයෝ) කුමක් කර ඇත්තෙමු ද? ඔවුහු (සෙසු ජන කොටස්වල අය) සමාජයේ විවිධ අංශවල විශිෂ්ට ගණයේ පුද්ගලයන් බිහි කොට ඇත්තාහ. ඔවුහු දක්ෂ නීතිවේදීන්, මන්ත්‍රණ සභිකයන් හා වෙනත් අංශවල විශිෂ්ට පුද්ගලයන් ද බිහි කොට ඇත්තාහ. රජයේ උසස් නිලධාරීහු කිසිවකුත් අපට සිටිත් ද? උසස් වෘත්තීන්හි යෙදෙන විශිෂ්ට පුද්ගලයෝ කිසිවකුත් අපට සිටිත් ද? දක්ෂ නාගරික මන්ත්‍රීවරයෙකු හෝ ව්‍යවස්ථාදායක මන්ත්‍රීවරයෙකු බිහි කිරීමට අපට හැකි වී තිබේ ද? වෙනෙකක් තබා අපේ ම පාසල් හා විද්‍යාල අතළොස්සක් වත් අපට තිබේ ද? අපි අපේ දරුවන්ගෙන් බොහෝ දෙනකු මුස්ලිම් නො වන පාසල්වලට යවා ඇත්තෙමු ද? අඩපණ වූ ආකාරයෙන් ක්‍රියාත්මක වන ප්‍රාථමික පාඨශාලා දෙකක් හෝ තුනක් නම් අප සතු වන බව ඇත්තකි. එහෙත් අපට එක ම විද්‍යාලයක් වත් ඇතැ යි අවංක ව ප්‍රකාශ කළ හැකි ද? පිළිතුර පැහැදිලි ලෙස ම නැතැයි කීම ය. සාර්ථක ව්‍යාපාරිකයන් හා ඉඩම් හිමි වැවිලිකරුවන් විශාල පිරිසකින් යුත් ජන කොට්ඨාසයකට මෙවැන්නක් පිළිගැනීමට සිදු වීම අවමානයට කරුණක් නො වන්නේ ද? තව දුරටත් මෙසේ සිටීම අපට තරම් නොවන්නේ ය. අපි වහා ම මෙය වෙනස් කළ යුතු වෙමු."

ටී. බී. ජායා මහතා මුස්ලිම් ජනයාගේ අධ්‍යාපනය විෂයයෙහි ලද සේවය අමරණීයත්වයට පත් කරවන ජීවමාන ස්මාරකය මරදානේ සහිරා විද්‍යාලය යි. ඉතා දුර්වල තත්ත්වයක පැවති සහිරාව දිවයිනේ ප්‍රථම පෙළේ විද්‍යාලයක් බවට පත් කිරීමේ ගෞරවය ඔහුට හිමි වෙයි. ඔහු එහි විදුහල්පති හැටියට පත් වූයේ 1921 දී ය.

එවකට නීතිඥ විභාගය අවසන් කිරීමට සූදානම් වෙමින් සිටි ඔහු නීතිඥ වෘත්තිය ඔස්සේ ස්වකීය පෞද්ගලික යහපත පහසුවෙන් ළඟා කර ගත හැකි ව තිබූ මාවත වෙනුවට සහිරා විද්‍යාලය නව ජීවනයට පත් කිරීමේ අවදානම් සහගත අභියෝගාත්මක කාර්යය එඩිතර ව භාර ගත්තේ ය. ඔහු විදුහල්පති වන විට එම විද්‍යාලයේ ආචාර්ය මණ්ඩලය හය දෙනෙකි; සිසුහු පනස් නවයකි; ගෘහ භාණ්ඩ යැයි කිව හැකි කිසිවක් නො තිබුණු තරම් ය. ගොඩනැගිල්ල ප්‍රාථමික පාඨශාලාවකට වුව ද යන්තම් පිරිමැසෙන තරම් ය. එම ගොඩනැගිල්ලට යාර විස්සකට තිහකට පමණ ඈතින් වූයේ පාතාලයේ සොරුන්ගේ තිප්පොළ ලෙස මහජනයා විසින් සලකන ලද වන ළැහැබකි. නමුත් මේ කිසිවකින් අධෛර්යයට පත් නොවූ ජායා මහතා අධිෂ්ඨාන පූර්වක ව වැඩ ආරම්භ කෙළේ ය. ඔහුගේ කැපවීම අපතේ නො ගිය අතර ඉතා කෙටි කලකින් ම විද්‍යාලයේ මානව හා භෞතික සම්පත් සංවර්ධනය කර ගැනීමට ඔහුට හැකියාව ලැබිණි.

දෙවන ලෝක යුද්ධය අවධියේ දී අගනුවර විද්‍යාලවල කටයුතු සීමා විය. මහජනයාට ඉමහත් දුෂ්කරතාවන්ට මුහුණ දීමට සිදු වූ අතර, බොහෝ දෙනා පදිංචිය සඳහා ඈත පළාත්වලට ගියහ. සහිරා විද්‍යාලය තාවකාලික ව වසා දමන ලද අතර එහි ගොඩනැගිලි හමුදාවේ ප්‍රයෝජනයට ගැනිණි. මේ අවස්ථාවේ දුර දක්නා නුවණින් යුක්ත ව කටයුතු කළ ජායා මහතා උදා වී ඇති අයහපත් තත්ත්වය මුස්ලිම් ශිෂ්‍යයන්ගේ අනාගත යහපතට හේතු වන්නක් බවට පත් කිරීමට උත්සුක විය. ඔහු එසේ කළේ කොළඹින් බැහැර ගිය මුස්ලිම් ශිෂ්‍යයන් සඳහා ඒ ඒ පළාත්වල පාඨශාලා විවෘත කිරීමෙනි. ඒ අනුව ගම්පොළ, අලුත්ගම, මාතලේ සහ පුත්තලම නගරවල සහිරා විද්‍යාලයේ ශාඛා බිහි විය. කොතෙක් දුෂ්කරතා පැමිණියය ද ඒ විද්‍යාල ඒ ඒ පළාත්වල මුස්ලිම් ශිෂ්‍යයන් සඳහා පවත්වාගෙන යනු ලබන අධ්‍යාපන ආයතන වශයෙන් වැඩෙන්නට විය. 1947 දී එම විද්‍යාලවලට ස්වාධීන ව ක්‍රියා කිරීමේ බලය ද පවරන ලදි.

ටී. බී. ජායා මහතා මුස්ලිම් ජනතාවගේ සමාජීය හා දේශපාලනික කටයුතුවල මෙහෙයුම්කරුවකු හා මාර්ගෝපදේශකයකු ලෙස වැදගත් සේවයක් ඉටු කෙළේ ය. මෙම සියවසේ දෙවන හා තුන්වන දශකවල දී මුස්ලිම් ජනතාව සමාජීය වශයෙන් අනෙකුත් ජන කොට්ඨාසයන්ට වඩා පසුපසින් සිටියහ. විශේෂයෙන් ඔවුනට ප්‍රමාණවත් බුද්ධිමත් නායකත්වයක් තිබුණේ නැත. 1924 දී ජායා මහතා ව්‍යවස්ථාදායක සභාවට පත් වූයේ මෙබඳු අවධියක දී ය. උගතකු හා අධ්‍යාපනඥයකු වූ ජායා මහතා කැපී පෙනෙන මුස්ලිම් ජන නායකයා බවට ඉක්මනින් පත් විය. මුස්ලිම් ජාතික රජයේ සේවකයන්ට ජුම්මා නිවාඩු ලබා දීමේ අවශ්‍යතාව පිළිබඳව කරුණු දක්වමින් 1925 ජනවාරි 19 වන දින මන්ත්‍රණ සභාවේ දී ඔහු කතාවක් ද කෙළේ ය. රාජ්‍ය මන්ත්‍රණ සභාවට නම් කරන ලද මන්ත්‍රීවරයකු ලෙස පත් වූ ඔහු 1936 සිට 1947 දක්වා විශාල සේවයක් කළේ ය.

1947 දී ඇති වූ මහා ගංවතුරකින් ගම්පොළ පහත් බිම් ප්‍රදේශවල ජීවත් වූ මුස්ලිම් පවුල් සිය ගණනකගේ ගෙවල් දොරවල් විනාශ වී අනාථ වූ අවස්ථාවේ ජායා මහතා හිස් වත්තක් රජයට අත්පත් කරගෙන ගෙවල් අහිමි වූ සියලු ම අයට නිවාස ඉදි කර දෙමින් මාරියාවත්ත

නිවාස යෝජනා ක්‍රමය ආරම්භ කෙළේ ය. එතුමා කම්කරු හා සමාජ සේවා ඇමති වශයෙන් රැකියා විරහිත අයට සහනයක් සැලසීමේ අරමුණින් 'විරක්ෂා සහන සේවය' නම් ව්‍යාපෘතිය ඇති කෙළේ ය. මෙය විරුද්ධ මත දරන දේශපාලකයන්ගේ පවා පැසසුමට ලක් විය.

පාකිස්ථානය සමඟ තානාපති සම්බන්ධතා ඇති වීමත් සමඟ එහි ප්‍රථම ලංකා මහා කොමසාරිස් වශයෙන් 1950 දී පත් කරනු ලැබීම ටී. බී. ජායා මහතාට කරන ලද ගෞරවයක් සේ සැලකිය හැකි ය. පාකිස්ථානයේ පංජාබ් විශ්වවිද්‍යාලය විසින් 1952 දී එතුමාට සාහිත්‍යසූරි ගෞරව උපාධිය පිරිනැමීමෙන් පැහැදිලි වන්නේ බුද්ධිමත් සම්භාවනීය රාජ්‍ය තාන්ත්‍රිකයකු ලෙස ඔහුට තිබූ පිළිගැනීම යි.

මක්කම ශුද්ධ නගර වන්දනාවට යන ශ්‍රී ලාංකික ඉස්ලාම් බැතිමතුන් උදෙසා ලැගුම් නිවාසයක් පිහිටුවීම සඳහා සෞදි අරාබියේ රජුගෙන් අවසර ගැනීමට එම රට බලා ගිය නියෝජිත පිරිසට නායකත්වය දීම එතුමාගෙන් සිදු වූ අවසාන පොදු කාර්යය විය. එම දූත ගමන සාර්ථක විය. මක්කම ශුද්ධ නගරය වන්දනා කොට මදීනා නගරයට යමින් සිටිය දී රෝගාතුර ව රජයේ රෝහලකට ඇතුළත් කරනු ලැබූ එතුමා 1960 මැයි 31 වන දින මෙලොව හැර ගියේ ය.

## අවබෝධය

1. **පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

   i. ටී. බී. ජායා මහතාගේ ජනතා සේවය කැපී පෙනෙන්නේ කුමන ක්ෂේත්‍රයක් සම්බන්ධයෙන් ද?

   ii. පසු කලෙක දේශපාලන ක්ෂේත්‍රයේ කැපී පෙනෙන සේවයක් කළ නායකයන්ට ඔහු ගුරුවරයෙක් වූයේ ය. එම නායකයන් නම් කරන්න.

   iii. ලාංකේය අධ්‍යාපනයට ඔහුගෙන් සිදු වූ සේවය කවරාකාර ද?

   iv. නීතිඥවරයකු වීමේ අවස්ථාව ඔහු විසින් අත් හරිනු ලැබුවේ කුමන පරමාර්ථයක් නිසා ද?

   v. එතුමාට සාහිත්‍යසූරි උපාධිය පිරිනැමුණේ කුමන ආයතනයකින් ද?

## ලිඛිත අභ්‍යාස

1. **පාඩමේ එන පහත සඳහන් තද්ධිත පදවල ප්‍රකෘති හා ප්‍රත්‍යය වෙන් කරන්න. එක් එක් වචනය යොදා අර්ථවත් වාක්‍යය බැගින් ලියන්න.**

   i. දීප්තිමත්
   ii. නාගරික
   iii. දක්ෂතා
   iv. බුද්ධිමත්
   v. පෞද්ගලික
   vii. දේශපාලනික
   viii. ප්‍රාථමික

2. **පාඩමෙන් උපුටා ගන්නා ලද පහත සඳහන් පදවල උපසර්ග වෙන් කොට ලියන්න. ඒ එක් එක් වචනය යොදා අර්ථවත් වාක්‍යය බැගින් තනන්න.**

i. විරක්ෂා
ii. අයහපත්
iii. ප්‍රයෝජන
v. අවංක
vii. සංවර්ධනය
viii. අවබෝධ

3. **පහත සඳහන් අවස්ථාවන්ගෙන් එකක් තෝරා ගෙන රාජකාරි ලිපියක් හෝ ව්‍යාපාරික ලිපියක් හෝ ලියන්න.**

i. රන්පොකුණගම විද්‍යාලයේ කලා සංගමයේ ලේකම් ඔබ යැයි සිතා කලා උලෙළ සඳහා ශබ්ද විකාශන යන්ත්‍ර හා වේදිකා ආලෝක පහසුකම් ඉල්ලමින් ප්‍රදේශයේ එබඳු පහසුකම් සපයන ව්‍යාපාරික ආයතනයකට යවන ලිපිය ලියන්න.

ii. ළඟ එන අ.පො.ස. (සා.පෙළ) විභාගයට පෙනී සිටීම සඳහා විද්‍යාලයේ අනෙකුත් සිසුන්ට ප්‍රවේශ පත්‍ර ලැබී ඇතත් ඔබේ ප්‍රවේශ පත්‍රය මේ වන තෙක් ලැබී නැත. ඒ බව දැනුම් දෙමින් විභාග ප්‍රවේශ පත්‍රය හැකි ඉක්මනින් ලබා දීමට කටයුතු කරන මෙන් ඉල්ලමින් විභාග කොමසාරිස් ජනරාල්තුමාට ලිපියක් ලියන්න.

## ප්‍රායෝගික අභ්‍යාස

1. **පන්තිය කණ්ඩායම් හතරකට බෙදී ටී. බී. ජායා මහතාගේ ජීවන චරිතයට අදාළ කරුණු පහත සඳහන් මාතෘකා ඔස්සේ පෙළගස්වන්න.**

i. අධ්‍යාපනය හා විශේෂ කුසලතා
ii. වෘත්තීය ජීවිතය
iii. ගුරුවරුන් උදෙසා කළ මෙහෙය
iv. දේශපාලන ක්ෂේත්‍රයට දැක්වූ දායකත්වය

# රාජකාරි ලිපි හා ව්‍යාපාරික ලිපි

ප්‍රායෝගික ජීවිතයේ විවිධ අවස්ථාවන්හි දී රාජකාරි ලිපි හා ව්‍යාපාරික ලිපි ලිවීමට අපට සිදු වේ.

රාජකාරි ලිපි ලිවීම ප්‍රායෝගික ලේඛන අතර වැදගත් ලේඛන කටයුත්තකි. රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ වෙනත් රාජ්‍ය ආයතන සමඟ මෙන් ම පෞද්ගලික ආයතන සමඟ ද රාජකාරි කටයුතු කිරීමේ දී මෙවැනි ලිපි ලිවීමට සිදු වෙයි. රාජකාරි/පෞද්ගලික ලිපියක ඇතුළත් විය යුතු ප්‍රධාන අංග කිහිපයකි.

## රාජකාරි හා ව්‍යාපාරික ලිපි ලිවීමේ නවතම ආකෘතිය

යවන්නාගේ ලිපිනය

දිනය

ලබන්නාගේ ලිපිනය

ආමන්ත්‍රණය

මාතෘකාව

(මාතෘකාවට අදාළ විස්තරය)

පළමු ඡේදය ..........................................................................................

..........................................................................................

දෙවන ඡේදය ..........................................................................................

..........................................................................................

තෙවන ඡේදය ..........................................................................................

..........................................................................................

ස්තුතිය (ව්‍යාපාරික ලිපියක නම් පමණි)

යවන්නාගේ අත්සන

නම

තනතුර